# පටුන


පෙරවදන
මහාචාර්ය දයානන්ද සෝමසුන්දර

සංස්කාරක
සී.එල්.අමරසේකර

01.නාට්‍ය නිර්මාණයෙහි දෘෂ්ටිය හා භාෂා යෝජනය පිළිබඳ විමර්ශනයක්
- මහාචාර්ය කේ.එන්.ඕ. ධර්මදාස

02.සුදුසුතර සිංහල සිල්පමය බසක් උදෙසා
- ඊලියන් ද සිල්වා

03.සබරගමුවේ අභිචාර විධි
- චම්පා ද සිල්වා

04.වර්තමාන ශ්‍රී ලංකා පක්ෂ ක්‍රමයේ හැඩ ගැසීම්
- එච්. රංජිත්

05.සමනල සිරිපද ලස ලද රජ බැති පුද හා කවි පද පුද
- මා මෛත්‍රීපාල

06.සාඵල්‍යතාවය, නිර්දාරකභාවය සහ නිර්දාරක-භාවයට බලපාන සාධක
- සමන් හඳරාගම

07.කෑගලු දිස්ත්‍රික්කයේ අධ්‍යාපනික සංවර්ධනය
- ටී. ගුණරත්න

08.සිංහල භාෂාව ඉන්දු ආර්ය ගණයේ භාෂාවක්ද
- ඩබ්. ආරියරත්න

09.සබරගමු නැටුම් කලාව හා සම්බන්ධ වූ පත්තිනි දේව වන්දනාව
- බන්දුල ලියනගේ

10.පැරණි සපරගමුව හා එහි අගනුවර
- කලවානේ ජයසේකර

# පෙරවදන

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය මගින් එහි ප්‍රථම ශාස්ත්‍රීය සංග්‍රහය වසර 2000 උදාවීමත් සමඟ නිකුත් කරන්නට ලැබීම සතුටට කරුණකි. විසිඑක්වන සියවස මෙන්ම තෙවන සහශ්‍රය උදාවන මොහොතේ ශාස්ත්‍රීය සංග්‍රහයක් එළිදැක්වීම තුළින් එම ඓතිහාසික අවස්ථාව විශ්වවිද්‍යාල ඉතිහාසයේ සනිටුහන් කිරීමට ලැබීම අමරණීය සිද්ධියක් වනු නොඅනුමානය.

ශ්‍රී ලංකා සබරගමුව විශ්වවිද්‍යාලය ආරම්භ කර වසර හතරක් වැනි සුළු කාලයක් තුළ ශාස්ත්‍රීය අතින් වැදගත් මෙවැනි කර්තව්‍යයක් සම්පූර්ණ කරන්නට ලැබීම විශේෂ ජයග්‍රහණයකි. විශ්වවිද්‍යාලයට වසර 02ක් පිරුණ අවස්ථාවේ "සබරගමුව යුනිවර්සිටි ජර්නල්" නමින් ඉංග්‍රීසි බසින් ශාස්ත්‍රීය සංග්‍රහයක් නිකුත් කරන ලද අතර එහි දෙවන කලාපයද නොබෝදා නිකුත් විය.

විශ්වවිද්‍යාලයකින් ඉටු විය යුතු ප්‍රධාන අරමුණු තුනකි. එනම්, ඉගැන්වීම, පර්යේෂණ කිරීම සහ ප්‍රජා සේවයයි. මෙවැනි ශාස්ත්‍රීය සංග්‍රහයකින් එකී අරමුණු තුනටම යම් කිසි ආකාරයකින් දායක වීමක් සිදුවේ. විශ්වවිද්‍යාලවල ශිෂ්‍යයන්ගේත්, ආචාර්යවරුන්ගේත් බාහිර ප්‍රජාවගේත් දැනුම් වර්ධනයට ඉවහල් වන ලිපි මෙහි අඩංගු නිසා ඉගැන්වීමේ කාර්යයට මෙය දායක වේ. විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ගේ හා බාහිර විද්වතුන්ගේ පර්යේෂණාත්මක ලිපි පළ කෙරෙන හෙයින් පර්යේෂණ සඳහා දිරිගැන්වීමක් සිදුවේ. එසේම පර්යේෂණයන්ගෙන් හෙළිවන කරුණු ප්‍රකාශයට පත් කරලීමේ මාධ්‍යයක් ලෙසද මෙම සංග්‍රහය වැදගත් වේ. තෙවනුව විශ්වවිද්‍යාල

ආචාර්යවරුන්ගේ පමණක් නොව සබරගමුව ප්‍රදේශයේ මෙන් ම ලංකාවේ බාහිර විද්වතුන්ගේ ලිපි පළ කිරීම මගින් ද ප්‍රදේශය සම්බන්ධයෙන් දැනුවත් කරන ලිපි අන්තර්ගත කිරීම මගින් ද ප්‍රජාවට සේවාවක් සැපයේ. මෙම සංග්‍රහය හුදෙක් විශ්වවිද්‍යාල ප්‍රජාව සඳහා පමණක් සීමා නොකර ඕනෑම විද්වතකුට විවෘත වීම නිසා බාහිර ප්‍රජා සම්බන්ධතාව ද බාහිර විද්වතුන්ගේ දායකත්වයද ලබා ගත හැකි වී තිබේ.

අද සිංහල භාෂාවෙන් ලියැවුණු ශාස්ත්‍රීය සංග්‍රහයන්ගේ හිඟයක් දක්නට ලැබේ. එම නිසා සුළු වශයෙන් හෝ එය පිරිමසාලීම මෙවැනි සිංහල භාෂාවෙන් වූ ශාස්ත්‍රීය සංග්‍රහන් එළි දැක්වීමේදී සැලකිල්ලට ගත් කරුණක් විය.

මෙම ශාස්ත්‍රීය සංග්‍රහයේ සබරගමුවට අදාළ ශාස්ත්‍රීය ලිපි කිහිපයක් ම පළ කරන ලද්දේ "සබරගමුව" පිළිබඳ අධ්‍යයනයන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම සබරගමුව පළාතේ පිහිටි උසස්ම අධ්‍යාපන ආයතනය වශයෙන් සබරගමුව විශ්වවිද්‍යාලයේ යුතුකමක් හා වගකීමක් ලෙස සලකාය. ඉදිරියේදීද සබරගමුව පිළබඳ ලියැවෙන ලිපිවලට හැකි පමණින් මෙම සංග්‍රහයේ ඉඩ ලබා දීමට බලාපොරොත්තු වෙමු.

සබරගමුව විශ්වවිද්‍යාලයට සම්බන්ධ ආචාර්යවරුන්ගේ පර්යේෂණාත්මක ලිපි සඳහා මෙම සංග්‍රහයෙන් ප්‍රමුඛත්වය දෙන අතර, වෙනත් විශ්වවිද්‍යාල, උසස් අධ්‍යාපන ආයතන පර්යේෂණායතන මෙන්ම වෙනත් දේශීය හා විදේශීය උගතුන්ගේ ලිපිද හැකිතාක් දුරට මෙහි පළ කිරීමට කටයුතු සලස්වා ඇත. අපගේ ආරාධනය පිළිගෙන මෙම සංග්‍රහය සඳහා ලිපි සැපයූ සියළුම විද්වතුන්ට විශ්වවිද්‍යාලයේ

කෘතඥතාව ද පිරිනමමු. මෙම කලාපයෙහි ඉඩ මදකම නිසා පළ කිරීමට නොහැකි වූ තෝරාගනු ලැබූ ලිපි ඉදිරි කලාපයෙහි පළ වනු ඇත.

මෙම සංග්‍රහයෙහි ශාස්ත්‍රීය ගුණාත්මක වටිනාකම රැකගනු පිණිස මෙහි පළ කෙරෙන සෑම ලිපියක්ම බාහිර විද්වතුන් ලවා විමර්ශනය කරවන ලදී. එසේ විමර්ශකයන් විසින් පළ කිරිමට නිර්දේශ කරනු ලැබූ ලිපි පමණක් මෙහි පළ කරනු ලැබීය. ලිපි විමර්ශනය සඳහා සහාය වූ විද්වතුන්හට විශ්වවිද්‍යාලයේ ගෞරව පූර්ව ස්තූතිය හිමිවේ. නව විශ්වවිද්‍යාලයක් හෙයින් ජ්‍යෙෂ්ඨ ආචාර්යවරුන් ඉතා දුළු පිරිසක් පමණ සිටින අවස්ථාවක බාහිර විද්වතුන්ගේ සහාය නොලැබෙන්නට මෙවැනි කාර්යයක් සාර්ථක කර ගැනිම ඉතාම අසීරුය.

මෙම ශාස්ත්‍රීය සංග්‍රහයෙහි සම්බන්ධීකරණ සංස්කාරක වශයෙන් කටයුතු කළ සමාජීය විද්‍යා හා භාෂා පීඨයේ, පීඨාධිපතිනි චන්ද්‍රා අමරසේකර මහත්මිය ඇතුළු සංස්කාරකවරුන්ට විශේෂයෙන් ස්තූතිවන්ත වෙමි. ලිපි එකතු කිරිම, විමර්ශනය කරවීම, සංස්කරණය කිරිම, සෝදුපත් කියවීම ආදි කාර්යයන් රැසක් සාර්ථකව ඉටු කිරීම මගින් පමණි සාර්ථක සංග්‍රහයක් එළි දක්වෙනුයේ. එකී කාර්යයන් සාර්ථක වී ඇතැයි මම සිතමි. තම අධික රාජකාරී කටයුතු මැද මෙම කාර්යය සාර්ථකව ඉටු කිරීම සම්බන්ධයෙන් චන්ද්‍රා අමරසේකර මහත්මියට මගේත් විශ්වවිද්‍යාලයේත් ස්තූතිය පළ කරමු. එසේ ම ඇයට සහාය වූ ආචාර්ය මණ්ඩලයේ සහ කාර්ය මණ්ඩලයේ සියළු දෙනාටද ස්තූතිවන්ත වෙමු.

මෙවැනි ශාස්ත්‍රීය සංග්‍රහයක් එළි දක්වීමටත් වඩා අසීරු කාර්යය වන්නේ එය අඛණ්ඩව පවත්වාගෙන යාමයි. ප්‍රමාණවත් ලිපි නොලැබීම, විමර්ශකයන්

සොයා ගැනීමේ අපහසුව, මුද්‍රණ වියදම්, අලෙවිකරණ ගැටළු වැනි විවිධ ප්‍රශ්න පැන නැඟීම තුළින් සඟරාවක අඛණ්ඩතාවයට හානි පැමිණිය හැකිය. මෙවැනි ගැටළු පිළිබඳව සලකා බලා වර්ෂයකට එක් කලාපයක් නිකුත් කිරීමට අදිටන් කර ගෙන මෙම සංග්‍රහය දියත් කළෙමු.

මෙම ශාස්ත්‍රීය සංග්‍රහය අඛණ්ඩව පවත්වා ගෙන යාම සඳහා සබරගමුව විශ්වවිද්‍යාලයට සම්බන්ධ හා විශ්වවිද්‍යාලයට හිතැති සියළුම විද්වතුන්ගේ හා පාඨකයින්ගේ සහයෝගය සහ අනුග්‍රහය ලැබේවායි ප්‍රාර්ථනා කරමි.

මහාචාර්ය දයානන්ද සෝමසුන්දර
උපකුලපති